**08-07-2024 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, තමාව අපහාසයට ලක් කරන්නන් වෙනුවෙනුත් කරුණාව දැක්වීමට පුරුදු වන්න. එමෙන්ම තමාව අපහාසයට ලක් කරන අයව තම මිතුරන් කර ගන්න.

**ප්‍රශ්නය:** පරමාත්ම පියාගේ ස්ථිර දැක්ම කුමක්ද? ඔය දරුවන් විසින් ස්ථිර කර ගත යුතු දැක්ම කුමක්ද?

**පිළිතුර:** සෑම ජීවාත්මයක්ම තමන්ගේ දරුවන්ය යන පරමාත්ම පියාගේ දැක්ම ඉතාමත් ස්ථිරයි. මෙන්න මේ නිසා තමයි ඔහු කියන්නේ: "දරුව, දරුව" කියලා. ඔබට කෙදිනකවත් කිසිම කෙනෙකුට එසේ දරුව කියා ඇමතිය නොහැකියි. ඒ ජීවාත්මයත් තමාගේ සහෝදර ජීවාත්මයක්ය යන දැක්ම ඉතාමත් හොඳින් තහවුරු කර ගත යුතුයි. සහෝදරයා දකින්න. සහෝදරයාට කතා කරන්න. එමඟින් ආධ්‍යාත්මික සෙනෙහසක් ඇති වේවි; සෑම දුෂ්ට සිතිවිල්ලක්ම නැති වී යාවි. ඔබට අපහාස කරන්නන් පවා ඔබගේ මිතුරන් වේවි.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පරමාත්ම පියා මෙහි සිට ඔබට පැහැදිලි කර කියනවා. ආධ්‍යාත්මික පියාගේ නම කුමක්ද අනිවාර්යෙන්ම කියාවි "ශිවා" කියලා. ඔහු සැමගේ ආධ්‍යාත්මික පියායි. පරමාත්ම දෙවියන් කියන්නේත් ඔහුට පමණයි. ඔය දරුවනුත් මෙය තම තමන්ගේ උත්සාහයේ ප්‍රමාණයට අවබෝධ කර ගන්නවා. ආකාෂ්වාණී ගැන කියනා විට, එසේ ඊතරයෙන් පැමිණෙන්නේ කාගේ හඬද? ශිව බාබාගේ හඬයි. මේ මුඛය තමයි ඊතර කියා හඳුන්වන්නේ. සෑම මානව ජීවාත්මයක්ම ඊතර (මුඛය) මඟින් හඬ පිට කරනවා. සෑම ජීවාත්මයක්ම තමන්ගේ පරමාත්ම පියාව අමතක කර දමා ඇත. ඔවුන් දිගටම එක් එක් ආකාරයේ ප්‍රශස්ත ගී කිය කියා ආවත් කිසිම දෙයක් ගැන දන්නේ නැහැ. ඔවුන් ඔහුව වර්ණනා කරන්නේ මෙහිදීයි. තමන්ගේ සෑම ආශාවක්ම ඉටු වී ඇති නිසා සතුට ඇති විට කිසිම කෙනෙක් පරමාත්ම පියාව සිහි කරන්නේත් නැහැ. වැස්ස නැති කාලෙට යාගහෝම පවත්වනවා. යාගහෝම පැවැත්වූවායි කියා අනිවාර්යෙන්ම වැස්ස ලැබෙනවායි කියාත් කිව නොහැකියි. ඇතැම්විට, යම් යම් දුර්භික්ෂ ඇතිවිය හැකියි. යාගහෝම පැවැත්වූවායි කියා කිසිවක් නොවෙන්නත් පුලුවන්. ඒක තමයි නාටකය. සිදුවීමට නියමිත සෑම ආපදාවක්ම සිදු වේවි. මිනිසුන් රැසක් සතා සිව්පාවුන් ආදියත් මිය යනවා. මිනිස්සු සිටින්නේ මහා දුකකින්. වැස්ස නැවැත්වීමට යාගයක් තිබෙනවා ද? මහා වැසි ඇද හැලෙන විටත් මිනිස්සු යාගහෝම පවත්වනවා. ඔබට පමණයි දැන් මේ සියල්ල වැටහෙන්නේ. වෙන කිසිම කෙනෙක් දන්නේ නැහැ. පරමාත්ම පියාම මෙහි සිට ඔබට කියා දෙනවා. මිනිස්සු පරමාත්ම පියාව වර්ණනා කරන අතර ඔහුට අපහාසත් කරනවා. ඒක මහා පුදුමයක්! කවදා ඉඳන් ද ඔවුන් බාබාට අපහාස කරන්න පටන් ගත්තේ? රාවත රාජ්‍යය ඇරඹුණු දා පටන්. ලොකුම අපහාසය නම් දෙවියන් සෑම තැනම සිටිනවායි කියා කීමයි. ඔවුන් කඩා වැටීමට ලක්ව තිබෙන්නේ මේ නිසායි. ඔබට අපහාස කරන අය තමයි ඔබගේ හොඳම මිතුරන් කියා කියනවා. වැඩියෙන්ම දෙවියන්ට අපහාස කර ඇත්තේ කවුද? ඔය දරුවනුයි. එමෙන්ම දැන් ඔහුගේ මිතුරන් බවට පත්ව සිටින්නේත් ඔය දරුවනුයි. ඇත්තටම කියනවා නම්, මුලු ලෝකයම ඔහුට අපහාස කරනවා. නමුත් එහිත් අංක එක ඔබලායි. පසුව ඔබ ඔහුගේ මිතුරන් වෙනවා. ළඟම මිතුරන් වන්නේ දරුවනුයි. පරමාත්ම පියා කියනවා: ඔය දරුවන් මාව අපහාසයට ලක් කළා. එමෙන්ම මට නින්දා කළ අයත් ඔය දරුවනුයි. බලන්න නාටකය නිර්මාණය වී ඇති ආකාරය. මේවා ඔබ විසින් ආවර්ජණය කළ යුතු ඥානයයි. "ඥාන සාගරය මත ගෑම" යන්නෙහි අරුත් රැසක් තිබෙනවා. කිසිම කෙනෙක්ට මෙය තේරුම් ගත නොහැකියි. පරමාත්ම පියා කියනවා: ඔය දරුවන් ඥාතය ඉගෙන ගෙන අන් අයව ඉහළට ගෙන එනවා. අන්ත අධර්මය රජයන කළ මම එම් කියාත් කියනවා. මෙය අදාල භාරතයටයි. බලන්න නාටක නිර්මාණය කොයි වගේද කියලා! මිනිස්සු ශිව ජයන්තිය හා ශිව රාත්‍රිය සමරනවා. ඇත්තෙන්ම කියනවා නම් ඇත්තේ එකම අවතරණයකුයි. ඒ අවතරණය වීමත් සෑම ගසක් ගලකම තිබෙනවා කියා මිනිස්සු කියනවා. පරමාත්ම පියා මේ ගැන චෝදනා කර ඇත. ගීතාව හදාරණ අයත් කියන්නේ තමන් ඒ කිසිම දෙයක් දන්නේ නැහැ කියලයි. සැමටම වඩා ආදරණීයම දරුවන් ඔබලායි. බාබා කවුරුන් සමඟ හෝ කතා කරනා විට ඔහු නිතර නිතර දරුව දරුව කියා කියනවා. සෑම කෙනෙක්ම තමාගේ දරුවන්ය යන පරමාත්ම පියාගේ දැක්ම ඉතාමත් ස්ථිරයි: සෑම ජීවාත්මයක්ම මගේ දරුවන්ය. ඔබගෙන් කිසිම කෙනෙක් "දරුව, දරුව" කියන්නේ නැහැ. එකිනෙකාගේ තත්ත්වය කොයි වගේද එකිනෙකා කවුරුන්ද කියා ඔබ දන්නවා. සෑම කෙනෙක්ම ජීවාත්මයක්. මෙම නාටකය කල්තබාම තීරණය වූවක් වන අතර ඒ නිසාම තමයි ඒ

ගැන කිසිම සතුටක් හෝ දුකක් නැත්තේ. සෑම කෙනෙක්ම මගේ දරුවන්. කෙනෙක් අඩු කුලයක ශරීරයක් ගෙන ඇති තවත් කෙනෙක් තවත් කුලයක ශරීරයක් ගෙන ඇති. බාබා "දරුව, දරුව" කියා කීමට පුරුදු වෙලා. බාබාගේ ඇස් දෙකට සෑම කෙනෙක්ම ජීවාත්මයක්. එයිනුත් ඔහු වැඩියෙන්ම ආදරය කරන්නේ දුප්පත් අයටයි. නාටකයට අනුව වැඩිපුරම අපහාස කර ඇත්තේ ඔවුනුයි. එමෙන්ම ඔවුන් දැන් මා ළඟට පැමිණ සිටිනවා. කිසිදු විටෙක අපහාසයට ලක් නොවූයේ ලක්ෂ්මි නාරායන පමණයි. මිනිස්සු ක්‍රිෂ්ණාවත් අපහාසයට ලක් කර තිබෙනවා. ඒක පුදුමයක්. ක්‍රිෂ්ණා ලොකු වෙනකොට කවුරුත් ඔහුට අපහාස කළේ නැහැ. මේ ඥානය ඉතාමත් ආකර්ෂණීයයි. කිසිම කෙනෙකුට මේ දේවල් තේරුම් ගත නොහැකියි. ඒ සඳහා රන් බුද්ධියක් අවශ්‍යයි. එය නිර්මාණය කළ හැක්කේ ස්මරණ වන්දනාවෙන් පමණි. මෙහි සිටිනා ගමන්, ඔබෙන් ඇතැම් අය තුළ නිවැරදි සිහි කිරීම නැහැ. තමන් කුඩා ජීවාත්මයත්ය යන අවබෝධය ඔවුන්ට නැහැ. ඔබලා බාබාව සිහි කළ යුත්තේ ඔබගේ බුද්ධියෙනුයි. එතරම් කුඩා ජීවාත්මයක් තමාගේ පරමාත්ම පියා මෙන්ම ගුරුවරයා ද වන බව ඔබගේ සිහියට ඇතුලු වන්නේ නැහැ. එය අසීරු දෙයක් වී තිබෙනවා. ඔබ නිතරම "බාබා, බාබා" කියා කියනවා. දුකින් පිරි මොහොතකදීත් ඔබ ඔහුව සිහි කරනවා. පරමාත්ම දෙවියන් කියන්නේ: සෑම කෙනෙක්ම දුකින් ඉන්නා විට මා සිහි කරනවා. සතුටින් ඉන්නා විට මාව සිහි කරන්නේ නැහැ. එකල මාව සිහි කිරීමේ අවශ්‍යතාවයකුත් නැහැ. මෙහි, ඇත්තේ මහා දුකක්, නොයෙකුත් වියසන ඇති වන විට ඔවුන් . අහෝ දෙවියනේ මට අනුකම්පා කරත්වා! වරම් දෙනු මැනව! දැනටත්, දරුවන් වෙලත් ඔබ: වරම් දෙනු මැනව! බලවත් කරනු මැනව! අනුකම්පා කළ සේක්වා! කියා කියනවා. බාබා ඔවුන්ට දෙන ප්‍රතිඋත්තරය නම්: යෝග බලයෙන් බලය එක්රැස් කර ගන්න! තමා කෙරෙහි අනුකම්පා සහගත වී වරම් ලබා ගන්න! ස්වාධිපත්‍යයේ තිලකය තමාට ලබා ගන්න! මම ඒ සඳහා වන මඟ ඔබට පෙන්වමි. ගුරුවරයා ඔබට ඉගෙනීමේ මඟ පෙන්වා දෙනවා. සිසුන්ගේ වගකීම ඉගෙන ගැනීම හා උපදෙස් පිළිපැදීමයි. ගුරුවරයෙක් යනු වරම් හෝ ආශිර්වාද දෙන ආකාරයේ ගුරු කෙනෙක් නොවෙයි. හොඳ දරුවන් දුවගෙන ඒවි. සෑම කෙනෙක්ම ස්වාධීනයි. තමාට හැකි පමණ වේගයෙන් සෑම කෙනෙකුට දිව ආ හැකියි. තරඟය නම් ස්මරණ වන්දනාවයි. සෑම ජීවාත්මයක්ම ස්වාධීනයි. බාබාත් ඔබව සහෝදර සහෝදරියන් යන සබඳතාවයෙන් මිදෙව්වා: තම තමන් සහෝදරයින් වශයෙන් සලකන්න. එසේ තිබීය දීත් ඇස් දූෂිත වීම නතර කරන්නේ නැහැ: ඔවුන් දිගටම තම කාර්යය කරගෙන යනවා. දැන් මේ කාලයේ දී මිනිස් ශරීරයේ සෑම ඉන්ද්‍රියක්ම දූෂිතයි. කෙනෙක් තවත් කෙනෙකුට පයින් ගැසුවහොත්, හෝ තල්ලු කළහොත් ඒවාත් දුෂ්ට දේ වෙනවා. සෑම ශාරීරක කොටසක්ම දූෂිත වෙලා.එහිදී කිසිම දූෂිත දෙයක් නැහැ. මෙහි සෑම ඉන්ද්‍රියකින්ම සිදු වන්නේ දුෂ්ට ක්‍රියාවකි. වැඩියෙන්ම දූෂිත කුමක්ද? ඇස්. රාගය සඳහා වන ආශාව අවසන්ව නැති විට. ඔවුන් අත් පාවිච්චි කිරීමට පටන් ගන්නවා. පළමුවෙන්ම ඇත්තේ ඇසුයි. සූර්දාස්ගේ කතාව මෙයයි (ඔහු තම ඇස් ගලවා දැමුවා). ශිව බාබා කිසිදු ආගමික ග්‍රන්ථයක් කියවා නැහැ. මේ රථය ඒවා හදාරා තිබෙනවා. ශිව් බාබා ඥාන සාගරයයි. ශිව් බාබා කිසිදු ආගමික පොතක් ගන්නේ නැති බව ඔබලා දන්නවා. මම ඥානයෙන් සපිරි බීජයයි. මෙය ලෝක වෘක්ෂය වන අතර එහි නිර්මාණකරු පරමාත්ම පියායි, බීජයයි. බාබා පැහැදිලි කර කියනවා: මගේ වාසස්ථානය අශාරීරික ලෝකයයි. මේ කාලයේ මම මෙම ශරීරයේ සිටිතවා. වෙත කිසිම කෙතෙකුට මම තමයි මානව ලෝක ගසෙහි බීජය කියා කිව නොහැකියි. මම පරමාත්ම පියා, පරමාත්ම ජීවයයි. වෙන කිසිම කෙනෙකුට මෙය කිව නොහැකියි. ඥානවන්ත කෙනෙකුට තවත් කෙතෙක් දෙවියන් සෑම තැනකම සිටිනවායි කියා කියුවහොත්, ඔහු නිසැකයෙන්ම: ඔබ දෙවියන් ද කියා ඔහුගෙන් අසාවි. ඔබ අල්ලාහ් ද කියා අසාවි. එසේ විය නොහැකියි. කෙසේවෙතත්, මේ කාලයේ කිසිම කෙනෙක් ඥානාන්විත නැහැ. ඔවුන් අල්ලාහ්ව දන්නේ නැහැ. එමනිසා. මමයි අල්ලාහ් කියා කියනවා. ඉංග්‍රීසි බසින් (ඔම්නිප්‍රසන්ට්) Omnipresent කියා කියනවා. මෙහි තේරුම දන්නවා නම් කවදාවත් ඔවුන් එසේ කියන්නේ නැහැ. ශිව් බාබාගේ ජයන්තිය යනු නව ලෝකයේ ජයන්තිය බව ඔය දරුවන් දන්නවා. පාරිශුද්ධත්වය. සාමය හා සතුට සියල්ල ඒ තුළ අන්තර්ගතයි. ශිව් ජයන්තිය, ක්‍රිෂ්ණ ජයන්තියයි. එය දශේරා ජයන්තියත් වෙනවා. ශිව් ජයන්තිය දීපමාලා ජයන්තියත් වෙනවා. ශිව් ජයන්තිය දෙව්ලොව උපතත් වෙනවා. සෑම උපතක්ම එකටම සිදු වෙනවා. පරමාත්ම පියා මෙහි සිට මේ සෑම අලුත් දෙයක්ම කියා දෙනවා. ශිව් ජයන්ති යනු ශිව දේවාලයේ උපත හා වේශ්‍යාගාරයේ අවසානයයි. පරමාත්ම පියා සෑම අලුත් දෙයක්ම ඔබට කියා දෙනවා. ශිව් ජයන්ති යනු නව ලෝකයේ උපතයි. මිනිස්සු ලෝක සාමය බලාපොරොත්තු වෙනවා. කෙතරම් හොඳින් පැහැදිලි කළත් ඒ අය අවදි වන්නේ නැහැ: ඔවුන් අවිද්‍යා අන්ධකාරයේ නිදි. ඔවුන් දිගටම භක්ති වන්දනාවන් කර කර ඉණීමහෙහි පහළට වැටී තිබෙනවා. පරමාත්ම පියා කියනවා: මා පැමිණ සෑම කෙනෙකුටම මුක්තිය දානය කරනවා. පරමාත්ම පියා දෙව්ලොවෙහි හා අපායේ රහස් කියා දෙනවා. ඔබලාට අපහාස කරතා පුවත්පත් මාධ්‍යවේදීන්ට ඔබ ලිවිය යුතුයි: අපට අපහාස

කරත අය අපගේ මිතුරනුයි. අපි ඔබටත් අනිවාර්යෙන්ම මුක්තිය සලසමි – ඔබට ඕනෑ තරමින් අපට අපහාස කරන්න. මිනිස්සු දෙවියන්ටම අපහාස කරද්දී අපට අපහාස කිරීම එතරම් දෙයක් ද? අපි අනිවාර්යෙන්ම ඔබට මුක්තිය සලස්වන්නෙමු. ඔබට එය අවශ්‍ය නැතිනම්, අපි ඔබව නහයෙන්ම අල්ලා ගෙන අපත් සමඟ ගෙත යන්නෙමු. බිය වීමට දෙයක් නැහැ. ඔබ දැන් කරනා දෙය සෑම කල්පයකදීම කළා. අපි බීකේවරුන් සෑම කෙනෙකුටම මුක්තිය දානය කළා. ඔබ ඉතාමත් හොඳින් විස්තර කළ යුතුයි. මීට පෙර කල්පයේදීත් අහිංසක කාන්තාවන් පීඩනයට ලක් වුණු බව ඔය දරුවන් අමතක කරනවා. පරමාත්ම පියා කියනවා: සියලුම අසීමිත දරුවන් මට අපහාස කරනවා. මගේ මිතුරු දරුවන් තමයි වැඩියෙන්ම ආදරයට ලක් වන්නේ. දරුවෝ මල්ය. දෙමාපියන් තම දරුවන්ව සිප වැළඳ ගන්නවා. පියා ඔවුන්ව තම හිස මත තබා ගෙන ඔවුනට සේවය කරනවා. බාබාත් ඔය දරුවන්ට සේවය කරනවා. ඔබලා දැන් මෙම ඥානය ගෙන තිබෙනා අතර පසුව එය රැගෙන යාවි. එය භාර නොගන්නා අය; එය ඔවුන්ගේ නාටකයේ කොටසයි. ඔවුන් ඒ චරිත කොටස රඟදක්වාවි. ඔවුන් තම කර්ම ගිණුම් පියවා දමා නිවහන වෙත යාවි. ඔවුන්ට දෙව්ලොව දැකිය නොහැකියි. සෑම කෙනෙක්ම දෙව්ලොව දකින්නේ නැහැ. මේ නාටකය කල්තබාම තීරණය වූවක්. මිනිසුන් මහා පව් කර පසුව පැමිණෙනවා. තමෝප්‍රධාන් අය පැමිණෙන්නේ බොහෝ ප්‍රමාද වෙලයි. මෙහි වැදගත්කම හොඳින් තේරුම් ගත යුතුයි. ඉතාමත් හොඳ මහාරාතී දරුවන් මත පවා නරක අපල තිබෙනවා, එමනිසා ඔවුන් ඉක්මනින් කේන්ති ගෙන ඒ ගැන ලියන්නේවත් නැහැ. බාබාත් කියනවා: ඔවුන්ට මුරලි යැවීම නතර කරන්න. එවන් දරුවන්ට පරමාත්ම පියාගේ සම්පත් දීමේ ඇති ඵලය කුමක්ද? පසුව කෙනෙකුගේ ඇස් ඇරුණහොත්, ඔහු කියාවි: මා වරදක් කළා. ඇතැම් අයට මේ ගැන කිසිම තැකීමක් නැහැ. එතරම් නොසැලකිලිමත් නොවිය යුතුයි. පරමාත්ම පියාව සිහි නොකරනා අයත් බොහෝ පිරිසක් සිටිනවා. ඔවුන් කිසිම කෙනෙක්ව තමා හා සම කරවන්නේ නැහැ. නැතිනම් ඔවුන් බාබාට ලියාවි: බාබා, මා සෑම මොහොතකදීම ඔබව සිහිපත් කරනවා. ඇතැම් අය සෑම කෙනෙකුගේම නම් ලියනවා: මා අහවල් අහවල් කෙනාව මතක් කළා කියන්න. ඒ සැබෑම සිහි කිරීම නොවෙයි. බොරුව පවතින්නේ නැහැ. ඔවුන්ගේ හිත ඔවුනට වද දේවි. බාබා ඔය දරුවන්ට ඉතාමත් හොඳ කරුණු කියා දෙනවා. දවසින් දවස බාබා ඉතාමත් ගැඹුරු කරුණු පහදා දෙනවා. දුක් කඳු පිටින් කඩා වැටීමටයි තිබෙන්නේ. ස්වර්ණමය යුගයේ කිසිදු දුකක් ගැන සඳහනක් නැහැ. දැන් ඇත්තේ රාවණ රාජ්‍යයයි. මයිසූරයේ රජු රාවණ පඹයෙක් සාදා ගෙන මහා ඉහළින් දශේරාව සමරණවා. ඔවුන් රාමාට දෙවියන් කියනවා. නමුත් රාමාගේ සීතාව පැහැරගත්තා. ඔහු සර්ව බලධාරි නම්, කොහොමද කෙනෙක් ඔහුගෙන් යමක් සොරා ගන්නේ? ඒ සියල්ල අන්ධ විශ්වාසයයි! සෑම කෙනෙක් තුළම පස්පව් කුණු තිබෙනවා. දෙවියන් සෑම තැනකම සිටිනවා කියා කීම මහා බොරුවක්. මෙන්න මේ නිසා තමයි පරමාත්ම පියා කියන්නේ: අන්ත අධර්මය පවතින කළ. මා පැමිණෙමි. මා පැමිණ සත්‍ය දේශය හා සත්‍ය ධර්මය ස්ථාපනය කරමි. ස්වර්ණමය යුගය සත්‍ය දේශය කියා කියනා අතර කලි යුගය අසත්‍යයේ දේශය වේ. පරමාත්ම පියා දැන් අසත්‍යයේ දේශය සත්‍යයේ දේශය බවට පත් කරවයි. අච්චා.

සුමිහිරි, ආදරණීය බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාදාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි.ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. මෙම ගැඹුරු හා ආකර්ෂණීය ඥානය අවබෝධ කර ගැනීමට, ස්මරණ වන්දනාවෙන් ඔබගේ බුද්ධිය රන් බඳුනක් කර ගන්න. ස්මරණ තරඟයේ දිව යන්න.
2. පරමාත්ම පියාගේ උපදෙස් පිළිපදින්න. අවධානයෙන් ඉගෙන ගන්න. තමා කෙරෙහි අනුකම්පා සහගත වී ආශිර්වාද තබා ගන්න. ස්වාධිපත්‍යයේ තිලකය තමාටම පළඳා ගන්න. ඔබට අපහාස කරන අයෙක් තමාගේ මිතුරෙක් බව සලකා ඔහුටත් මුක්තිය දානය කරන්න.

**වරදානය:** ඔබ ආශිර්වාද ලබා දෙන ප්‍රතිරූපයක් වී උඩ ඉහළින් අවතරණය වෙමින් අවතරණයක්ව සේවය කරන සේවාකරුවෙක් වේවා.

පරමාත්ම පියා සූක්ෂම කලාපයෙන් මෙතැනට පැමිණෙන්නේ යම් සේද, ඒ ආකාරයෙන්ම ඔබ ද සේවය කිරීමට සූක්ෂම කලාපයෙන් පැමිණිය යුතුය. ඔබ මෙම දැනුවත්භාවය තුළ සේවය කරන විට, නිරතුරුවම නොබැඳිව සිටින අතර පරමාත්ම පියාට සමානව ලෝකයෙන් සෙනෙහස ලබනවා ඇත. ඉහළ සිට මෙහි පැමිණෙනවා යනු අවතරණයක් ලෙස සේවය

කිරීම වේ. සියල්ලන්ටම අවශ්‍ය වන්නේ අවතරණය වුණු ජීවාත්මයක් පැමිණ ඔහු සමග තමන්ව ආපසු රැගෙන යාමයි. එසේනම්, සියලු දෙනාවම නැවත විමුක්ති දේශයට රැගෙන යන ඔබ සැබෑ ජීවාත්මයන්ය. ඔබ අවතරණය වුණු ජීවාත්මයක් ලෙස සලකමින් සේවය කරන විට, ඔබ ආශීර්වාද ලබා දෙන ස්වරූපයක් බවට පත් වන අතර බොහෝ දෙනාගේ ආශාවන් ඉටු වේ.

**පාඨය:** කවුරුන් විසින් ඔබට හොඳ හෝ නරක කුමන දෙයක් ලබා දුන්නද, ඔබ කළ යුත්තේ ඔවුන් කෙරෙහි කරුණාව දැක්වීම සහ සැමට සෙනෙහස සහ සහයෝගය ලබා දීමයි.

***** ඕම ශාන්ති *****